# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1313 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 18/10/2023 පැය 0740

## මාධ්‍ය නිවේදනය

### 01. වෙඩි තැබීමක් - කිරුලපන පොලිස් වසම.

2023.10.17 වන දින රාත්‍රී කාලයේ කිරුලපන පොලිස් වසමේ අංක 54, කිරුලපන මාවත ප්‍රදේශයේදී යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් අහසට වෙඩි තබා පලාගොස් ඇති බවට කිරුලපන පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

වෙඩි තැබීම හේතුවෙන් කිසිවෙකුටත් තුවාල සිදුව නොමැති අතර කවුරුන් විසින් වෙඩි තැබීම සිදුකලාද යන්න මෙතෙක් අනාවරණය වී නොමැත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කිරුලපන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. දිරාගිය අස්ථි කොටස් හමුවීමක් - වැලිකන්ද පොලිස් වසම.

2023.10.17 වන දින වැලිකන්ද පොලිස් වසමේ කුඩාපොකුණ රක්ෂිතය තුල දිරාගිය අස්ථි කොටස් හා කාන්තා ඇඳුම් පැලඳුම් කොටස් ඇති බවට වැලිකන්ද පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මෙම අස්ථි කොටස් තිබූ ස්ථානයෙන් හමුවූ කාන්තා ඇඳුම් කොටස්, අත්බෑගය, හිස්වැසුම හා කෑම පෙට්ටිය 2019.11.14 වන දින සිංහපුර වැලිකන්ද ප්‍රදේශයේ අතුරුදහන් වූ කාන්තාවකගේ බවට සැකකරන අතර අස්ථි කොටස් හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මක පරීක්ෂණ සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**